# G.C.E. ORDINARY LEVEL

## අ.පො.ස. සාමාන්‍ය පෙළ

**STUDENT SEMINAR SERIES - 2017**

**ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017**

# SINHALA LANGUAGE & LITERATURE

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## QUESTION PAPER - I

## ප්‍රශ්න පත්‍රය - I




**Powered by**

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**

# අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ 1 |
|---|---|---|

සැලකිය යුතුයි.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 40කි.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත කොටසෙහි අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

(01) පාලකයාගේ **කෙනෙහිලිකම්** හේතුවෙන් ආයතනය පිරිහීමකට ලක් වූ බව සේවකයෝ පවසති.
1. සිත් රිදවා හැසිරීම.
2. හිතවත්කම්
3. පිරිසකට පමණක් සැලකීම.
4. දැඩි සතුරුකම්

(02) ග්‍රාම නිලධාරිතුමා හමු වීමට ගිය සිරිවර්ධන **ආපසින් ම** ගෙදර පැමිණියේ ය.
1. ගිය විගස ම
2. පය ඉදිරියට තබා
3. සිතේ සතුටින්
4. හිතේ දුකෙන්

(03) අම්මා **වහෙන් ඔරෝවෙන්** කියූ දෙය අමාලිට නො තේරුණි.
1. සත්‍ය සඟවා
2. සත්‍ය ලෙස
3. වක්‍රව
4. ඍජු ලෙස

- අංක 05 සිට 07 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) ජල කළමනාකරණය සම්බන්ධ ක්‍රියාත්මක මට්ටමේ පවතින ව්‍යාපෘතියක් ලෙස පුරාණ වැව් ........................කිරීම දැක්විය හැකි ය.
1. නිර්මාණය
2. ප්‍රතිසංස්කරණය
3. සුරක්ෂිත
4. වාෂ්පීකරණය

(05) පාඨකයා සාහිත්‍ය නිර්මාණයක් ........................ කරනුයේ තමන් මීට පෙර අත් නොවිඳි අන්දමේ අත්දැකීමක් විඳ ගැනීමට ය.
1. සංරක්ෂණය
2. පරිවර්තනය
3. පරිශීලනය
4. පරිරක්ෂණය

(06) නාට්‍ය අධ්‍යක්ෂවරයා නාට්‍ය නිෂ්පාදනය කිරීමට උපයෝගී කර ගන්නේ රචකයා ........................ පිළියෙල කළ නාට්‍ය පිටපත යි.
1. විධිමත්ව
2. රසවත්ව
3. සංවරව
4. සංක්ෂිප්තව

(07) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව පද ගැළපූ වරණය තෝරන්න.
1. එංගලන්තය , ඇමරිකාව , බ්‍රිතාන්‍යය , කෙන්යාව
2. ආර්ජන්ටිනාව , සුඩානය , සිරියාව , සෝමාලියාව
3. ඕස්ට්‍රේලියාව , කැනඩාව , යේමනය , හංගේරියාව
4. උගන්ඩාව , ඔස්ට්‍රියාව , ජපානය , චීනය

(08) සඤ්ඤක අක්ෂර හඳුන්වන වෙනත් නමක් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. අනුනාසික අක්ෂර ය.
2. වර්ගාන්ත අක්ෂර ය.
3. නාසික්‍ය අක්ෂර ය.
4. අර්ධානුනාසික්‍ය අක්ෂර ය.

(09) ච, ඡ, ජ, ඣ, ඦ අක්ෂර අයත් වර්ගය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. කණ්ඨජ ය.
2. තාලුජ ය.
3. මූර්ධජ ය.
4. දන්තජ ය.

(10) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. දෘෂ්ටි , උච්චාරණය , දීර්ඝ , කැලණි
2. මර්දනය , අනර්ඝ , කුෂ්ට , මාර්ගස්ථ
3. ව්‍යඤ්ජන , ප්‍රාසංගික , තුෂ්ටි , වළාකුල
4. දෘශ්‍යාධාර , ඓක්‍යය, සම්ප්‍රදාන, ඖෂධ

(11) සෑම වාක්‍යයක ම අක්ෂර වින්‍යාසය දෝෂ දෙකකට **වැඩියෙන්** යෙදුණු වාක්‍ය තෝරන්න.
1. විද්‍යාත්මක හා ශාස්ත්‍රීය ලේඛණයක දී ඉස්මතු වන්නේ කරුණු, තොරතුරු හා සාධක ය.
2. වර්ථමාන පාඨකයෝ දැණුම සඳහා ද වින්දනය සඳහා ද කියවති.
3. වාක්‍ය රීති අනුගමනය කිරීමෙන් ප්‍රශස්ත ලෙස භාෂාව භාවිත කිරීම සන්නිවේදන කාර්යයේ දී වැදගත් වේ.
4. වගා ලිංවලින් ඉවත් කල පස් , භූ විද්‍යාඥයින් විසින් පරීක්‍ෂාවට ලක් කෙරිනි.

(12) හුරු , නැව , ඌන , හෘදය
මෙහි ඉරි ඇඳි පදවල යෙදී ඇති පිල්ලම් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. ඇදපිල්ල , පාපිල්ල , ගැටපිල්ල , ගයනුකිත්ත
2. පාපිල්ල , ඇලපිල්ල, ගයනුකිත්ත , ගැටපිල්ල
3. පාපිල්ල , ඇදපිල්ල , ගැටපිල්ල , ගයනුකිත්ත
4. පාපිල්ල , ඇදපිල්ල, ගයනුකිත්ත , ගැටපිල්ල

(13) ගෙය , කන්ද , මහල්ලෝ , සිංහයා යන පදවල ප්‍රකෘතිය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ගෙ , කන්ද , මහල්ල , සිංහයා
2. ගෙය , කඳු , මහලු , සිංහ
3. ගෙය , කඳු , මහලු , සිංහයා
4. ගෙ , කඳු , මහලු , සිංහ

(14) ප්‍රත්‍යයාර්ථ නාමයක් **නොයෙදුණු** වාක්‍ය තෝරන්න.
1. සාහිත්‍ය විචාරක කාර්යයේ දී විචාරාත්මක බස් වහර පරිහරණය කිරීම අත්‍යවශ්‍ය වේ.
2. ප්‍රකෘති අලංකාරයේ මධ්‍යස්ථානය වූ නෙල්ලි කැලේ මගේ රාජ්‍යයට අයත් උද්‍යානයකි.
3. ඉපැරණි චාරිත්‍රවලින් සමන්විත දළදා පෙරහැර ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිඹිබු කරන උත්සවයක් ලෙස සැලකෙයි.
4. නිර්මාණකරුවා ඇසුරු කරන සමාජයෙන් ද අත්දැකීම් ලබා ගනියි.

(15) බහුවචන අනුක්ත පද පමණක් යෙදී **ඇති** පිළිතුර තෝරන්න.
1. මිනිසුන් , ඈ , සිංහයන් , වෙළෙන්දෝ
2. ගුරුවරුන් , භික්ෂූන් , ගැහැනියක , ඔවුන්
3. දරුවන් , සතුන් , ව්‍යාපාරිකයන් , සෙස්සන්
4. සේවකයන් , බමුණෝ , කාන්තාවන් , දාසයන්

(16) උපසර්ග පදයක් යෙදී **නැති** පිළිතුර තෝරන්න.
1. මැටි කාර්මිකයා සොබාදහම සමග ඉතා සමීප දිවියක් ගත කළේ ය.
2. කවීහු විවිධ ශිල්පීය උපක්‍රම භාවිත කරමින් සාරවත් නිර්මාණ ඉදිරිපත් කිරීමට වෙහෙසෙති.
3. අතිවිශාල ලාභ ලැබූ ප්‍රබල සමාගම්වලට රාජ්‍ය නායකයන් හැසිරවීමට පවා හැකි විය.
4. බලශක්ති උත්පාදනයට අද ජලය භාවිත කෙරෙයි.

(17) මුලින් දී ඇති පදයට **සමානාර්ථවත්** පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. උදක - ජලය , දිය , අඹ , දල
2. අනංගයා - මල්සර , මලවි , පන්සිළු , මින්දද
3. උද්දීපන - හැඟීම් දනවන , තියුණු කරන , ප්‍රබෝධ කරන , අනුරාගය ඇති කරන
4. චිරන්තන - පුරාතන , පැරණි , ආදි , නූතන

(18) මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථවත්** පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. වර්ධනය - සංවර්ධනය , අභිවර්ධනය , දියුණුව , ප්‍රගමනය
2. උත්කෘෂ්ට - අධම , උසස් , අදීන , විශිෂ්ට
3. කෘතවේදී - සංවේදී , කෘතඥ , ගුණවන්ත , ගුණෝපේත
4. අනල්ප - ස්වල්ප , සුග , කුඩා , ටික

(19) පද දෙකෙහි ම අර්ථයක් නොමැති යුගල පද යෙදී ඇති වරණය තෝරන්න.
1. වං හුං , තක්කු මුක්කු , තාන්න මාන්න , අබල් බබල්
2. පඩි නඩි , වත ගොත , අලි ඇත්තු , නගින දෙගින
3. සණ්ඩු සරුවල් , වත් පොහොසත් , ලොක්කො බක්කො , ඉදුම් හිටුම්
4. දරු මල්ලෝ , තෑගි බෝග , බත බුලත , ගල් මුල්

(20) පහත දැක්වෙන පද යොදා වාක්‍ය සකස් කිරීමේ දී නිවැරදි පිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සිය තරුණ වියේ දී විලියම් ශේක්ස්පියර්ට අවශ්‍ය ......... විවේකය තිබෙන්නට ඇත.
2. රාජ සභාවල දී විලියම් ශේක්ස්පියර්ගේ නාට්‍යවල විශේෂ දර්ශන ......... රංගගත කරන ලද්දේ ය.
3. ශේක්ස්පියර්ගේ ජීවිතය ......... පරිපූර්ණ සටහනක් ඉදිරිපත් කිරීම අපහසු ය.
4. ශේක්ස්පියර්ගේ කවියක් නාට්‍යයක් ගැන හැඳින්වීමක් කිරීම ......... අසීරු ය.

**A - නිතර** **B – ඉතා** **C- පිළිබඳ** **D - තරම්**

1. DBAC
2. DABC
3. DCAB
4. DACB

(21) නිපාත පද **දෙකක්** පමණක් යෙදුණු වාක්‍යය තෝරන්න.

1. වර්තමානයේ දළදා පෙරහැර නර්තනාංග රැසකින් සමන්විත ය.
2. ඈ සුරඟනක මෙන් සුන්දර කාන්තාවක් වූවා ය.
3. රචනා ලිවීම ලේඛන කුසලතා වර්ධනයට ඉවහල් වන ක්‍රියාකාරකමකි.
4. සාහිත්‍යකරුවා තමා අත්දුටු දෙය ඒ ආකාරයෙන් ඉදිරිපත් නො කරයි.

(22) මුලින් දී ඇති පදයට **බහ්වර්ථවත්** පද පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. සල - අචල , ශාලාව , ගල , චංචල
2. තුරු - තෙක් , අතුරු , ගස් , තාරකා
3. දද - කුෂ්ඨය , කොඩිය , බමුණා , පක්ෂියා
4. සර - විල , කාන්තාව , නාදය , වර්ණය

(23) පහත සඳහන් පැදියේ රූපකාර්ථවත් යෙදුම ඇතුළත් වරණය තෝරන්න.

සුර බිලිඳෝ සඳ කැලුම්
තළත සමන් මල් නොහිමි
බිහිරි වෙති යි කන සියුම්
නවතති දී අත් කුසුම්

1. සමන් මල් 2. කන සියුම් 3. අත් කුසුම් 4. සඳ කැලුම්

(24) පහත දී ඇති පද්‍ය පාදවල උපමාවක් යෙදී **නැති** පිළිතුර තෝරන්න.

1. පහන් බැවින් පිටතට සස ලෙසින් වත
2. නුඹ සා මඩුලු සඳ වෙලෙන ළපලු පැහැපත
3. සුරපුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ
4. බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන වට

(25) විභක්ති සමාසයට නිදසුනක් වන පිළිතුර තෝරන්න.
1. මුහුදු සුළං 2. අපිරිසිදු 3. මලවි 4. ප්‍රතිසංස්කරණය

(26) 1 බාලිකාවෝ උදෑසන ම පාසලට යති.
2 රියදුරු විසින් බසය පදවනු ලබයි.
3 රජු කෙරෙහි තේජස පවතී.
4 අපි පොතපතින් උගනිමු.

උක්ත අංකිත පද පිළිවෙළින් ගැළපූ විට නිවැරදි විභක්ති පද වර්ගය සහිත වරණය වනුයේ,

1. කර්තෘ , ආධාර , ප්‍රථමා , කරණ විභක්තිය වේ.
2. ප්‍රථමා , ආධාර , කර්තෘ , කරණ විභක්තිය වේ.
3. ප්‍රථමා , කර්තෘ , ආධාර , කරණ විභක්තිය වේ.
4. ප්‍රථමා , කරණ , ආධාර , කර්තෘ විභක්තිය වේ.

(27) පහත (අ) කොටසේ දැක්වෙන සන්ධි පදය සමග (ආ) කොටසට අයත් සන්ධි නාමය අනුපිළිවෙළින් ගැළපෙන වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1 මුදලිඳු | E පූර්වස්වර ලෝප සන්ධිය |
| 2 දුරින් | F ස්වරාදේශ සන්ධිය |
| 3 දෑවර | G පරස්වර ලෝප සන්ධිය |
| 4 රුවනාර | H ස්වර සන්ධිය |

1. G F E H　　2. G H F E　　3. G E F H　　4. G E H F

(28) **කළු අකුරින් මුද්‍රිත** පද අයත් ක්‍රියා වර්ගය නිවැරදිව යෙදෙන වර්ණය තෝරන්න.

★ **කියමින්** ගී රස මියුරු
★ **කියත** උන් මෙතෙපල
★ හිතේ දුකට නිදි නැතුවා **කියාපන්**
★ බුද්ධිය උඹ තමයි එදා පාර **කියා** දුන්නේ

1. මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , විධි ක්‍රියා , පූර්ව ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , විධි ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා

(29) "මාමේ, දේශගුණික ආපදාවලට උදාහරණ විදිහට නියඟ , ජල ගැලීම් එහෙම කියන්න පුළුවන් නේද?" මෙම වාක්‍යයේ ඇතුළත් වී **නොමැති** විරාම ලක්ෂණය තෝරන්න.

1. යුගල උඩු කොමාව　　2. ප්‍රශ්නාර්ථ ලකුණ
3. තනි උඩු කොමාව　　4. නැවතීමේ ලකුණ

(30) නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.

| | |
|---|---|
| A දියදොස් | E තොණ්ඩුව |
| B මී හරකා | F කුඩහලුවා |
| C මුදුන | G පැණි කොමඩු |
| D පිරිමි ළමයා | H ඇම්බරයා |

1. A H　　2. B F　　3. D G　　4. C E

(31) "...................................... සුරු නර විරු කැල
යළි හෙළ බිම ඉපදේවා " මෙහි හිස්තැනට යෙදෙන කවි පදය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. බුජ පළ බල කළ　　2. බුජ බල කළ පළ
3. බුජ කළ පළ බල　　4. බුජ බල පළ කළ

● වැරදි අදහස ඇති වාක්‍යය තෝරන්න.

(32) 1. ඌෂ්මාක්ෂර සර්ෂ නමින් ද හැඳින්වේ.
2. පාලි සංස්කෘත භාෂාවලින් සිංහල භාෂාවට පැමිණ ඇති තත්සම වචනවල 'ෆ' අක්ෂරය යෙදේ.
3. මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන දෘෂ්ටිගෝචර සංකේත අක්ෂර නම් වේ.
4. ලේඛනය යනු භාෂණය හෙවත් කථනය දෘශ්‍ය රූප බවට පත් කිරීමේ මාර්ගය යි.

(33) 1. කර්ම කාරකයට හැරවිය හැක්කේ සකර්මක ක්‍රියා පදයක් ඇති වාක්‍ය පමණි.
2. නිශ්චිතව කර්තෘ ප්‍රකාශ කළ නොහැකි අවස්ථාවල දී බොහෝ විට කර්මකාරක යෙදුම් දැකිය හැකි ය.
3. උපමාවාචී නිපාතයකට පූර්වයේ යෙදෙන්නේ උක්ත නාම පදයකි.
4. ඝෝෂ අක්ෂරයට පෙරටුව යෙදෙන විට 'ත්' යන්න අනුරූප ඝෝෂ ශබ්දය වන 'ද්' බවට පත් වේ.

- උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව යෙදී **ඇති** වාක්‍යය තෝරන්න.

(34) 1. වෘත්තීය සමිති නායකයෝ කිහිප දෙනෙක් සාකච්ඡාව මෙහෙයවූහ.
2. වෘත්තීය සමිති නායකයන් කිහිප දෙනෙක් සාකච්ඡාව මෙහෙයවූහ.
3. වෘත්තීය සමිති නායකයන් කිහිප දෙනෙකු සාකච්ඡාව මෙහෙයවයි.
4. වෘත්තීය සමිති නායකයෝ කිහිප දෙනෙකු සාකච්ඡාව මෙහෙයවූහ.

(35) 1. ප්‍රදේශවාසීහු ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙති'යි නිලධාරීහු පවසති.
2. ප්‍රදේශවාසීන් ඩෙංගු රෝග මර්දනයට සහාය නොදෙන්නේ' යි නිලධාරීහු පවසති.
3. ප්‍රදේශවාසීහු ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙන්නේ' යි නිලධාරීහු පවසයි.
4. ප්‍රදේශවාසීන් ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙති' යි නිලධාරීහු පවසති.

(36) 1. බිඟු කැල තඹරු පෙති මත රැඳී සිටී.
2. තුරු පෙළ අපූරු අලංකාරයක් මවති.
3. මල් පොකුර නෙත් සිත් ඇද ගත්තෝ ය.
4. ළමා රංචුව ක්‍රීඩා පිටිය දෙවනත් කරති.

- පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

(37) <u>වඳුරන් ගෙවල් හදනවා වාගෙයි.</u>
1. සාකච්ඡාවෙන් පසු ගෙවල් සෑදීම.
2. ගස් අතු මත ගෙවල් සෑදීම.
3. සාකච්ඡාව මිස වැඩක් නොකර සිටීම.
4. ප්‍රයෝජනයට ගත නොහැකි ගෙයක් සෑදීම.

(38) <u>ලිබ්බොක්කේ ලැග්ග බළලා වාගෙයි.</u>
1. අලසකමින් සිටීම
2. ලිබ්බොක්කේ පදිංචි වී සිටීම
3. උණුසුම සොයා යාම
4. කුස්සියෙන් එළියට නොයාම

(39) 'සේවකයෝ ටිකක් වැඩට ඇවිල්ලා' මෙය ලිඛිත ව්‍යවහාරයෙන් දැක්වූ විට නිවැරදි පිළිතුර තෝරන්න.
1. සේවකයෝ කිහිප දෙනෙක් වැඩට පැමිණ ඇත
2. සේවකයන් කිහිප දෙනෙක් වැඩට පැමිණ ඇත
3. සේවකයෝ කිහිප දෙනෙකු වැඩට පැමිණ ඇත
4. සේවකයින් කිහිප දෙනෙකු වැඩට පැමිණ ඇත

- පහත දී ඇති ගද්‍ය කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(40) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම පාඨකයාට වින්දනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය.

1. පාඨකයාට වින්දනයක් ඇති වන ආකාරයෙන් අර්ථවත්ව අත්දැකීම් ඉදිරිපත් කිරීම සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි කරන්නකි.
2. සාහිත්‍යකරුවාගේ කාර්යභාරය වන්නේ අර්ථවත් නිර්මාණයක් නැවත ඉදිරිපත් කිරීමයි.
3. අර්ථවත් අත්දැකීමක් යොදා නැවත පාඨකයාට වින්දනයක් ලබා දීමෙන් සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.
4. අත්දැකීමක් තෝරා ගැනීමත් එය නැවත ඉදිරිපත් කිරීමත් නිසා සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය අර්ථවත් වේ.



ඉන්ටනෙට් සෙල්ලං
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි